# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## ජනරාජ පදනම (සංස්ථාගත කිරීමේ)

**ජනරාජ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින්
2023 අගෝස්තු මස 10 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 ජූලි මස 17 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[197 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 24.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# ජනරාජ පදනම (සංස්ථාගත කිරීමේ)

## ජනරාජ පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

''ජනරාජ පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංවිධානයක්, එකී සංවිධානයේ සාමාජිකයන් එකඟ වූ නීති රීතිවලට අනුව හා අනුගතව, එකී පදනමට සම්බන්ධව සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද;

එකී සංවිධානය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථයන් සාක්ෂාත් කර ගනු උදෙසා ද, එකී පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී සංවිධානය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී සංවිධානය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, එකී ඉල්ලීම ඉටු කිරීම මහජන සුබසෙත ඉටු කිරීම පිණිස වන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක     දරන ජනරාජ පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් සමාජ සුබසාධනයම පරමාදර්ශය කොටගත් මෙම රාජ්‍ය නොවන සංවිධානය ජනරාජ පදනම යනුවෙන් හඳුන්වනු ලැබේ.

ජනරාජ පදනම සංස්ථාගත කිරීම

**2.** මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට හා ඉන් පසු (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් සඳහන් කරනු ලබන) ජනරාජ පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන එකී පදනමට සාමාජිකයන් වශයෙන් මෙයින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු ''පදනම'' යනුවෙන් හඳුන්වනු ලබන) ''ජනරාජ පදනම'' යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකිය. තව ද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය හා අධිකාරය ඊට ඇතුළත් ය.

ජනරාජ පදනමේ පොදු පරමාර්ථ

**3.** මෙම පදනම පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ජාති, ආගම්, කුල ආදිය කිසිදු අනු බෙදීමකින් තොරව මානව වර්ගයාගේ යහපත සාක්ෂාත්කරණය;

(ආ) දුප්පත්කම පිටු දැකීම හා සාමාජිය පැවැත්මට පවත්නා බාධා හඳුනා ගැනීම හා එමගින් මානව දියුණුවේ ආලෝකය උදාකිරීමට පුරෝගාමී වීම;

(ඇ) පටු බෙදීම්වලින් තොර වූ හා විවිධ සංස්කෘතීන් පිළිබඳ සැබෑ අවබෝධයෙන් යුතු සාමකාමී හා මිත්‍රශීලී හැඟීම් සහගත ශ්‍රී ලාංකික ප්‍රජාවක් බිහි කිරීම උදෙසා ඇප කැප වීම;

(ඈ) මිනිස් වර්ගයා සදාචාරවත් කරන්නා වූ විවිධ ආගමික හරපද්ධතීන් අන්‍යෝන්‍යයව වටහාගත් සමාජයක් නිර්මාණය කිරීමට දායක වීමෙන්, වඩාත් සුචරිතවත් පුරවැසියන්ගෙන් පූර්ණිත රටක් නිර්මාණය කිරීමට දායකවීම;

(ඉ) ජාතිකාභිමානය හා දේශාභිමානය ගොඩනැගිය යුතු වන්නේ ජාතිය, ආගම, කුලය හෝ වෙනත් වාර්ගික පදනමක් මූලික කොට ගෙන නොව, ශ්‍රී ලාංකීය පුරවැසියකුය යන මූලික සංකල්පය පදනම් කොට ගනිමින් ය යන්න හෘද සාක්ෂියට එකතු කොටගත් පුරවැසියකු නිර්මාණය කිරීමට මූලික වීම;

(ඊ) සියලුම ආගමික ශාස්තෘන් වහන්සේලාගේ දැක්ම වූ කලී මානව සංහිඳියාව හා සමාජ සුබසාධනය පමණක් ම බව සැමට ඒත්තු ගැන්වීම හරහා වඩාත් සමීප හා සැකයෙන් තොර මානව ප්‍රජාවක් බිහිකිරීමට උත්සුක වීම;

(උ) අධ්‍යාපනය සඳහා ආගම, ආර්ථිකය, වයස, ලිංගිකත්වය, පරිසරය හෝ වෙනත් එවැනි සාධකයක් හරස් විය නොයුතුය යන අදහස ජනගත කිරීම හා ඒ පිළිබඳ ව පවත්නා සියලු බාධාවන් ට එරෙහිව ක්‍රියාත්මකවීමට ක්‍රියා කිරීම;

(ඌ) සියලු ආගම් භේදයකින් තොරව ම, දේශීය සංස්කෘතික හර පද්ධතීන් ආරක්ෂා කර ගැනීම, සංරක්ෂණය කිරීම, ව්‍යාප්ත කිරීම, ඇගයීම අන්‍යෝන්‍යයව අවබෝධ කර ගැනීම, හා ඒවා විනාශවීමට පවත්නා බාධා බැහැර කිරීමට පියවර ගැනීම;

(එ) සකලාංග කලාව හා කලා ශිල්ප ද, සෞන්දර්යය, වින්දනය හා අවබෝධය පිළිබඳ මානව සිතුම් පැතුම් හැඩගැස්වීමට පුරෝගාමීවීම මෙන්ම ඒවා ඇගයීම මෙන්ම ව්‍යාප්තවීමට පවත්නා බාධා හඳුනාගෙන එකී බාධා මඟහරවා ගැනීමට දායකවීම;

(ඒ) වත්මන් සාහිත්‍ය කලාව පෝෂණය කිරීම මෙන්ම ඉපැරණි සාහිත්‍ය කෘති පිළිබඳ ඇගයීම, දැනුම හා අවබෝධය ලබා දීමත්, විශේෂිත ව ශිෂ්‍ය ප්‍රජාව ඒ කෙරේ වඩාත් සමීප කිරීමත් පිළිබඳව යාවත්කාලීනව ක්‍රියාත්මක වීම;

(ඔ) මෙකී අභිලාශයන් අතර විශේෂයෙන් සඳහන්ව නොතිබුණා වූ ද, ඒ අනුසාරයෙන් අදහස් වන්නා වූ ද, හා ආනුෂාංගිකව පිළිගැනෙන්නා වූ ද වෙනත් හා වැඩිමනත් කරුණු අවබෝධ කොට ගනිමින් ඒවායෙහි අප්‍රමාදව නියැලීම.

පදනම සතු බලතල

4. මෙම පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, පදනමේ සාමාන්‍ය බලතල:–

(අ) පදනමේ කාර්යය සඳහා අවශ්‍ය වන දායක මුදල්, හා ප්‍රදානයන් පරිත්‍යාග හා සියලු ආකාරයේ ත්‍යාග ඉල්ලා සිටීමට හා භාර ගැනීමට;

(ආ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, කුලියට, බද්දට නැතහොත් අන්‍ය ආකාරයකින් ලබා ගැනීමට;

(ඇ) සංස්ථාවේ කාර්යයන් සඳහා පොලී සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීමට හෝ ලබා ගැනීමට;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු හා වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සෑදීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් කිරීමට, පිටසන් කිරීමට, මිලට ගැනීමට, විකිණීමට නිකුත් කිරීමට හා බැංකු ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට හා වැසීමට;

(ඉ) සංස්ථාවේ කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් විධායක සභාව විසින් සුදුසු යයි සලකනු ලබන ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඊ) පදනමේ පරමාර්ථ මුදුන්පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන පරිදි, යම් තැනැත්තකු හෝ යම් සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් හෝ සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළැඹීම;

(උ) යම් චංචල හෝ නිශ්චල දේපලක් කෙරෙහි බලපාන නීත්‍යනුකූල භාර කිසිවක් හෝ කොන්දේසි භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට හා පරිපාලනය කිරීමට;

(ඌ) සංස්ථාවේ නිලධාරීන් සහ සේවකයන් පත් කර ගැනීමට, සේවයෙහි නියුක්ත කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීමට හා සංස්ථාව විසින් නිශ්චය කරනු ලබන යම් වැටුප්, දීමනා හා පාරිතෝෂික ගෙවීමට;

(එ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යයි ගම්‍යමාන වන්නා වූ වෙනත් යම් දෙයක් වේ නම් එකී සියලු දේ කිරීමට සංස්ථාවට බලය ඇත්තේ ය;

(ඒ) සංවිධානයේ පිළිගත් රීති නොසිඳ කටයුතු කිරීමේ වගකීම සෑම සාමාජිකයකු ම සතු වගකීමකි.

පදනමේ ව්‍යුහය

**5.** (1) තත් කාලයේ සංස්ථාවේ බල පවත්නා රීතිවලට අනුකූලව විධිමත් වූ ආකාරයෙන් යෝජනා සම්මත කොට පත් කර ගනු ලබන්නා වූ කළමනාකාර මණ්ඩලයක් විසින් සංස්ථාවේ කටයුතු පරිපාලනය කළ යුතු වේ.

(2) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පූර්ව දිනය වන විට පදනමේ ධුර දරමින් සිටි සාමාජිකයන්ගෙන් සංස්ථාවේ පළමුවන කළමනාකරණ මණ්ඩලය සමන්විත විය යුතු වන්නේ ය.

(3) කළමනාකරණ මණ්ඩලය පහත සඳහන් ව්‍යුහය තුළ ව්‍යුත්පන්න විය යුතු වන්නේ ය:–

(අ) සභාපති;

(ආ) උප සභාපතිවරු තනතුරු 03 (විවිධ විෂයයන් යටතේ පත් කර ගනු ලබන්නා වූ);

(ඇ) ලේඛකාධිකාරී;

(ඈ) සහකාර ලේඛකාධිකාරී තනතුරු 03 (විවිධ විෂයයන් යටතේ පත් කර ගනු ලබන්නා වූ);

(ඉ) සංවිධායක ලේකම්;

(ඊ) මූල්‍ය විධායක;

(උ) සහකාර මූල්‍ය විධායක;

(ඌ) විධායක සභාව (සාමාජිකයන් අට දෙනෙකුගෙන් සමන්විත විධායක සභාවක් පත් කර ගැනීම අවශ්‍යය).

(4) කළමනාකරණ මණ්ඩලයේ පොදු වගකීම්:–

(අ) සභාපති–

(i) සංවිධානයේ නායකත්වය උසුලමින් එහි සියලු කටයුතුවල වගකීම දරයි;

(ii) සියලු රැස්වීම්වල මුලසුන හොබවයි;

(iii) සංවිධානයේ කළමනාකරණ මණ්ඩලයේ යහ පැවැත්ම හා මනා සම්බන්ධීකරණය ගොඩනගයි;

(iv) සියලු අවශ්‍යතා ප්‍රතිව්‍යුහගත කරයි;

(v) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන දායක මුදල්, හා ප්‍රදානයන්, පරිත්‍යාග හා සියලු ආකාරයේ ත්‍යාග ඉල්ලා සිටීමට හා රැස්කර ගැනීමට අවශ්‍ය සැලසුම් සම්පාදනය කරයි.

(ආ) උප සභාපතිවරු–

(i) සභාපතිවරයා නොමැති කල් හි හා ඔහුගේ නියමය පරිදි සභාපතිවරයාගේ කාර්යයන් ආවරණය කරයි;

(ii) තමන් වෙත පවරන ලද හෝ භාර කරන ලද ව්‍යාපෘතීන් නිසි පරිදි සංවිධානය කොට පවත්වාගෙන යති.

(ඇ) ලේඛකාධිකාරි–

(i) සියලු වාර්තා සටහන් කර තබයි;

(ii) රැස්වීම් සංවිධානය කොට වාර්තාගත කරයි;

(iii) කළමනාකරණ මණ්ඩලය අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනී;

(iv)) නව යෝජනා නව ව්‍යාපෘතීන් පිළිබඳ වාර්තා සටහන් රැස්කර තබා ගන්නා අතර, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශ මුදාහරී.

(ඈ) සහකාර ලේඛකාධිකාරී (තනතුරු 03)–

(i) ලේඛකාධිකාරී විසින් බෙදාහරිනු ලබන වැඩ පැවරීම් ඔහු වෙනුවෙන් ආවරණය කරයි;

(ii) ලේඛකාධිකාරීවරයාගේ සියලු කාර්යයන් සඳහා ක්‍රියාශීලී සහය සපයයි.

(ඉ) සංවිධායක ලේකම්–

සංවිධානය විසින් ඉටු කරනු ලබන සියලු විශේෂ ව්‍යාපෘතීන් නිවැරදිව හා කාර්යක්ෂමව ද සංවිධානය කිරීමේ වගකීම උසුලයි;

(ඊ) මූල්‍ය විධායක–

(i) සියලු මූල්‍යමය පරිපාලනය සිදු කරයි;

(ii) සියලු ගනුදෙනු විධිමත්ව ද, අරපිරිමැස්මෙන් යුතුව ද, කාර්යක්ෂමව ද, නිවැරදිව ද, විනිවිදභාවයෙන් යුතුව ද පවත්වාගෙන යාම සිදු කරයි;

(iii) ඒ පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම හා එකී වාර්තා දෛනිකව යාවත්කාලීන කිරීමට බැඳී සිටී;

(iv) මූල්‍ය කළමනාකරණය පිළිබඳ නිවැරදි දත්ත රැස්කර ගනිමින්, ඒ පිළිබඳ විධිමත් වාර්තා මඟින් කළමනාකරණ මණ්ඩලය දැනුවත් කිරීම සිදු කරයි.

(උ) සහකාර මූල්‍ය විධායක–

(i) මූල්‍ය විධායකවරයාගේ කටයුතුවල දී උපරිම සහය දැක්වීම සිදු කරයි;

(ii) මූල්‍ය විධායකවරයා නොමැති අවස්ථාවන්හි දී ඔහුගේ වැඩ ආවරණය කිරීම භාරගනී.

(ඌ) විධායක සභාව (සාමාජිකයන් අට දෙනකුගෙන් සමන්විත විධායක සභාවක් පත් කර ගැනීම අවශ්‍යය).

මෙම විධායක සභාවේ සාමූහික වගකීමට අතිරේක වශයෙන් පහත සඳහන් අනු විෂයයන් හි වගකීම් එක් එක් විධායක සභිකයා වෙත පවරා භාර දිය යුතු වේ:–

(අ) ආර්ථික හා ප්‍රජා සේවා;

(ආ) කලාව, කලා ශිල්ප, සෞන්දර්යය හා සාහිත්‍යය;

(ඇ) ක්‍රීඩා හා ජන ක්‍රීඩා උත්සව හා තරගාවලි;

(ඈ) ආගමික හා සංස්කෘතික කටයුතු;

(ඉ) කෘෂිකාර්මික කටයුතු, පාරම්පරික හා දේශීයත්ව ඇගයීම් පද්ධති;

(ඊ) පරිසර හා වන ජීවී ක්‍රියාකාරකම්;

(උ) අධ්‍යාපනික හා නව තාක්ෂණික ශිල්ප ක්‍රම;

(ඌ) ගිණුම් පරීක්ෂක.

(5) කළමනාකාර මණ්ඩලයේ රැස්වීම්–

(අ) කළමනාකරණ මණ්ඩලයේ පත්වීම් බලපැවැත්වෙන්නේ දෙවසරක කාලයක් සඳහා ය;

(ආ) නියමිත කාලය ඉක්ම ගොස් එක් මසක කාලයකට පෙරාතුව, රට තුළ හදිසි තත්ත්වයක් උද්ගතව නොමැත්තේ නම්, නව කළමනාකරණ මණ්ඩලයක් පත් කර ගැනීම අත්‍යවශ්‍ය වන්නේ ය;

(ඇ) එසේ නව මණ්ඩලයක් පත් කර ගැනීම කාලාවරෝධී වී තිබේ නම්, එබඳු සභාවකට කිසිදු ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමේ හෝ වෙනත් එබඳු සක්‍රීය ක්‍රියාකාරකමක් සිදු කිරීමට හෝ පවත්වාගෙන යාමට හැකියාවක් නොමැති බව ස්ථාවර නියමයකි;

(ඈ) අවම වශයෙන් තෙමසකට වරක්වත් පූර්ණ කළමනාකරණ මහා සභාවක් පැවැත්වීම අත්‍යවශ්‍ය වන අතර, ඒ සඳහා නොපැමිණි සාමාජික ප්‍රජාවද ඇතුළත්ව ගණනය කළ කල්හි තුනෙන් එක ඉක්ම වූ බහුතරයක බලය ඇත්නම් මිස කිසිඳු යෝජනාවක් සම්මත නොකළ යුතු ය. කිසිදු තීරණයක් නොගත යුතු ය;

(ඉ) එසේ ම සාමාජික ප්‍රජාවගේ තුනෙන් එකක සහභාගිත්වයෙන් කරන ලද ලිඛිත ඉල්ලීමකට පිළිතුරු වශයෙන් මහා සභා රැස්වීමක් කැඳවීම ලේඛකාධිකාරීවරයාට පැහැර හැරිය නොහැකි ය;

(ඊ) සෑම කළමනාකරණ මණ්ඩලයක් ම, තමන්ගේ නව පත්වීමෙන් පසු මසක් ඇතුළත, ඉදිරි දෙවසර සඳහා සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කළ යුතු අතර, එය සම්මත කර ගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කිරීමේ වගකීම ඔවුන් වෙත පැවරෙන බව තරයේ මතක තබා ගත යුතු ය.

**සංවිධානගත අරමුදල**

**6.** (1) මෙම සංවිධානයට අරමුදලක් තිබිය යුතු අතර, එම අරමුදල එහි ක්‍රියාකාරකම් හා යෝජිත ව්‍යාපෘති සම්පාදනය සඳහා යොදාගත යුතු වේ.

(2) ඒ සඳහා සංවිධානය වෙනුවෙන් භාර ගනු ලබන ත්‍යාග, රික්තාවරණ පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලු මුදල් කළමනාකරණ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන රාජ්‍ය බැංකුවක හෝ කීපයක සංවිධානයේ ගිණුමේ බැරට තැන්පත් කළ යුතු ය.

(3) සංවිධානයට දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම, හෝ වැඩි දියුණු කිරීම සඳහා යම් ක්ෂය අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංවිධානය විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(4) මෙම පනත යටතේ ස්වකීය බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී පදනම විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු වන්නේ ය.

**පදනමේ ගිණුම හා විගණනය**

**7.** (1) පදනම සිය සියලුම ආදායම් හා වියදම් පිළිබඳව නිසි හා විධිමත් ගිණුම් පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු ය.

(2) මෙම ගිණුම හෝ ගිණුම්, පදනමේ ගිණුම් පරීක්ෂකවරයා විසින් කළ යුතු වාර්ෂික විගණන පරීක්ෂණයකට භාජනය විය යුතු ය.

(3) පදනමේ මුදල් වර්ෂය වශයෙන් සැළකිල්ලට ගත යුත්තේ සෑම වසරකම ජනවාරි මස පළමු (01) වන දින සිට දෙසැම්බර් තිස් එක (31) අතර කාලයයි.

**සංවිධානය විසින් හා සංවිධානයට ගෙවිය යුතු මුදල්**

**8.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව වූ දිනයෙහි පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර එදිනට පදනමට ගෙවිය යුතු ග්‍රාහක මුදල් හා දායක මුදල් මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

විසුරුවා හැරීමේදී ඉතිරි වන දේපළ

**9.** (1) මෙම පදනම විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් ගෙවා සමථයකට පත් කිරීමෙන් අනතුරුව කවර ආකාරයේ හෝ යම් දේපළක ශේෂගතව පැවැතියහොත්, එකී දේපළ පදනමේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු ය.

(2) මෙම පදනමේ පරමාර්ථවලට සමාන වූ පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආනුෂාංගික ආදායමක් හෝ දේපළක් සිය සාමාජිකයන් අතර බෙදාහල යුතු බවට රීතියක් පනවා නැත්තා වූ ද, නැතහොත් එසේ සාමාජිකයන් අතර බෙදාහැරීම රීතියක් මගින් තහනම් කර ඇත්තා වූ ද, ආදායම් නොලබන යම් ආයතනයකට හෝ ආයතනවලට එකී දේපළ හා බැරකම් හරවා යැවීම සඳහා, සුදුසු එබඳු ආයතන කවරේදැයි සොයා බැලීම හා බැහැර කිරීම, පදනම විසුරුවා හැරීමට ප්‍රථම ව කළමනාකාර මණ්ඩලය විසින් කළ යුතු වන්නේ ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**10.** මෙම පනතේ සඳහන් තැනැත්තන් මගින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් මගින් සාමාජිකයන් හෝ ඔවුන්ගේ හිමිකම්පාන්නන් හැර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අන්තර්ගත කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**11.** මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.